රිච්මන්ඩ් විද්‍යාලය ගාල්ල

# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය -2020
## First Term Test - 2020

| 11 | S | I,II |
|---|---|---|

**බුද්ධ ධර්මය I, II**
Buddhism **I, II**

**කාලය පැය තුනයි.**

**නම / අංකය - ..........................................................................**

**11 ශ්‍රේණිය**

**I කොටස**

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **I කොටසේ එක් ප්‍රශ්නයක් සඳහා ලකුණක් බැගින් හිමිවේ.**

(01). දෙව්ලොවෙහි දී බෝසතාණන් වහන්සේ විසින් සිදු කළ 'පංච මහා විලෝකනය' යනු,
i. දෙවිවරුන්ගේ ආරාධනය පිළිගැනීම.
ii. අවසන් උපතට සුදුසු පසුබිම විමසීමයි.
iii. ලෝක ධාතු පහක් පිළිබඳ සෙවීමයි.
iv. මිනිස් කුල පහක් පිළිබඳ බැලීමයි.

(02). බුදුරජාණන් වහන්සේ දෙවියන්ට හා මනුෂ්‍යයන්ට මාර්ගෝපදේශක ශාස්තෘවරයා වූ හෙයින්,
i. ලෝකවිදූ නම් වන සේක.
ii. සම්මා සම්බුද්ධෝ නම් වන සේක.
iii. සත්තා දේව මනුස්සානං වන සේක
iv. සුගත නම් වන සේක.

(03). බුදුරජාණන් වහන්සේ මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ හිඳිමින් තමන් වහන්සේගෙන් පිහිට ලැබිය යුතු අය පිළිබඳ විමසනු ලැබුවේ,
i. පෙරබත් කිසෙහි දීය.
ii. පෙරයම් කිසෙහිදීය.
iii. මැදියම් කිසෙහිදීය.
iv. පැසුළු යම් කිසේදීය.

(04). බුදුරජාණන් වහන්සේ චින්තන, විමංසන නිදහස අගය කළ සූත්‍රය වන්නේ,
i. කාලාම සූත්‍රය.
ii. පත්තකම්ම සූත්‍රය
iii. සෝණදණ්ඩ සූත්‍රය
iv. මංගල සූත්‍රය

(05). තම රූපයන්ගේ හටගැනීම සම්බන්ධ පටිච්ච සමුප්පාදයෙහි දැක්වෙන නිවැරදි අනුපිළිවෙළ,
i. අවිජ්ජාව, සංඛාර , විඤ්ඤාණ, නාම රූප
ii. අවිජ්ජාව, විඤ්ඤාණ, සළායතන, නාමරූප
iii. විඤ්ඤාණ, සලායතන,සංඛාර නාමරූප
iv. අවිජ්ජාව, සංඛ්, සලායතන, නාමරූප

(06). තෙරුවන් ගුණ සංඛ්‍යාව
i. නවයකි. ii.හයකි iii. දොළහකි. iv. විසිහතරකි

(07). 'ඉන්ද්‍රිය සංවරය' යනු සිල්වත්ව සමාධි භාවනාව සඳහා යොමුවන පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංගයකි. එම ඉන්ද්‍රිය නම්,
i. ඇස, කණ, නාසය, දිව, ශරීරය හා මනසයි.
ii. රූප, වේදනා, සංඥා, සංකාර හා විඤ්ඤාණයයි.
iii. රූප, ශබ්ද, ගන්ධ, රස , ස්පර්ශ හා ධර්මයි.
iv. පිං, පව්, කුසල් , අකුසල්, සීලය හා සමාධියයි.

(08). “මෙවන් පුතෙකු ලද මව නිවුණේ වෙයි” මෙවන් පුතෙකු ලද පියා නිවුණේ වෙයි.මෙවන් සැමියෙකු ලද බිරිඳ නිවීම ලැබ සිටින්නියකි.” මෙම අර්ථය ගෙන දෙන ගාථා හඳුන්වන්නේ,

i. ඡත්තමානවක ගාථා නමින්ය.
ii. නරසීහ ගාථා නමින්ය.
iii. ජය මංගල ගාථා යන නමින්ය.
iv. නිබ්බුත පද නමින්ය.

(09). බෞද්ධ ජීවිතය හොඳින් ගතකළ යුතු ආකාරය දක්වමින් ඇති පූජ්‍ය රේරුකානේ චන්ද්‍රවිමල නාහිමිපාණන් වහන්සේ විසින් රචනා කරනු ලැබූ ග්‍රන්ථය

i. “පොහොය දිනය” නම් වේ .
ii. ධර්ම විනිශ්චය නම් වේ
iii. බෞද්ධයන්ගේ අත්පොත නම් වේ
iv. පාරමිතා ප්‍රකරණය නම් වේ.

(10). “සිල්වත් සමාගම” නමින් සංවිධානයක් පිහිටුවා ගෙන බුදු සසුන නඟා සිටුවීමට කටයුතු කළේ,

i. රේරුකානේ චන්ද විමල හිමි.
ii. වාරියපොළ සුමංගල හිමි
iii. වැලිවිට සරණංකර හිමි
iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(11). ධම්ම පදයේ ඇතුළත් වග්ග 26 තුළ අඩංගු ගාථා ගණන,

i. 324 කි.    ii.243 කි    iii. 432 කි    iv. 423 කි

(12). බුදුරජාණන් වහන්සේ විසින් මුල, මැද, අග, මැනවින් ගළපා දේශනා කරන ලද ධර්ම රත්නයෙහි ඒක් ගුණයකි.

i. බුද්ධ ධර්මය අනුගමනය කරන්න වුන්ට ඇස්පනාපිටම විපාක ලබා දෙන බවයි.
ii. බුද්ධ ධර්මය අනුගමනය කරන්න වුන්ට කල් නොයවා සැප විපාක ලබා දෙන බවයි.
iii. බුද්ධ ධර්මය ඒව බලව යන විධානයට සුදුසු වන බවයි.
iv. බුද්ධ ධර්මය සිත්හි තබා ගත යුතු හෙයින් සිත් හි එලවිය යුතු ස්වභාවයෙන් යුක්ත වන බවයි.

(13). ලෝකයේ වසන සියලු මිනිසුන් කුමන ජාතියකට කුලයකට ආගමකට අයත් වුවද ඒ සියලු දෙනා ඉදිරියේ පොදු මූලික මහා ගැටළුව,

i. සංසාර දුකයි.
ii. බෝ නොවන රෝග
iii. සීලය පිරිහීමයි
iv. ඉවසීම නැතිකමයි.

(14). බුදු දහමේ පංච නීවරණ උපමා මගින් දක්වා තිබේ. එහිදී පාසි සහිත ජලයට උපමා කර ඇත්තේ,

i. ථීනමිද්ධය
ii. විචිකිච්චාව
iii. ව්‍යාපාදය
iv. උද්දච්ච කුක්කුච්චය.

(15). බුදුරජාණන් වහන්සේගේ “අරහං” ගුණය පදනම් කරගෙන දඹදෙණි යුගයේදී, රචනා වී ඇති ග්‍රන්ථය හා කතුවරයා ලෙස සැලකෙන්නේ,

i. සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන නම් තෙරුන්ය.
ii. පූජාවලිය - මයුරපාද පිරිවෙන්පති නම් තෙරුන්ය.
iii. සද්ධර්මාලංකාරය - ධර්මකීර්ති නම් තෙරුන්ය.
iv. පඤ්චිකා ප්‍රදීපය - තොටගමුවේ ශ්‍රී රාහුල නම් තෙරුන්ය.

(16). අස්සජි මහරහතන් වහන්සේ විසින් උපතිස්ස පිරිවැජියාට බුදුරජාණන් වහන්සේ හඳුන්වා දෙනු ලැබුයේ,

i. හේතුඵල සබඳතාව පෙන්ව දෙන්නා ශාස්තෘවරයෙක් ලෙසිනි
ii. චතුරාර්යසත්‍ය පෙන්වා දෙන්නා ශාස්තෘවරයෙක් ලෙසිනි
iii. දුක්ඛ දහම පෙන්වා දෙන්නා ශාස්තෘවරයෙක් ලෙසිනි
iv. කර්ම වාදය පෙන්වා දෙන්නා ශාස්තෘවරයෙක් ලෙසිනි.

(17). මුනිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය, සතර බණවර සන්න යන ග්‍රන්ථ රචනා කළේ,
- i. රේරුකානේ චන්ද විමල හිමි
- ii. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
- iii. වැලිවිට සරණංකර හිමි
- iv. වීදාගම මෛත්‍රී හිමි.

(18). "තණ්හා පච්චයා උපාදානං" යන ගාථා පාඨය අනුව තණ්හාව ඇති වීම සිදුවන්නේ,
- i. සුඛ දුක්ඛ ආදී වේදනා ඇතිවීමෙනි
- ii. සිතින් දැඩිව අල්වා ගැනීමෙනි
- iii. නාම රූප හෙවත් පංචස්කන්ධය ඇතිවීමෙනි
- iv. නැවත නැවත සසරට ඒකතු වීමෙනි

(19). බුදුරජාණන් වහන්සේට ජේතවනාරාමය පූජාකළේ,
- i. කුක්කුට සිටුතුමාය
- ii. ධනංජය සිටුතුමාය
- iii. පූර්ණවර්ධන සිටුතුමාය
- iv. අනේපිඬු සිටුතුමාය

(20). පංච අභිඥා අෂ්ට සමාපත්තිය ලබා ගැනීමට උපකාරී වන භාවනාව වනුයේ,
- i. සමථ භාවනාවයි
- ii. විදර්ශනා භාවනාවයි
- iii. මෛත්‍රී භාවනාවයි
- iv. අසුභ භාවනාවයි

(21). සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගිය තැන විශාලා මහනුවරදී සබ්බකාමී මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සිදු වූයේ,
- i. පළමු සංඝායනාවයි
- ii. දෙවන සංඝායනාවයි
- iii. තෙවන සංඝායනාවයි
- iv. හතරවන සංඝායනාවයි

(22). බුද්ධත්වයෙන් පසු බුදුන් වහන්සේ තෙවන සතිය ගත කළේ,
- i. අනිමිස ලෝචන පූජාවෙනි
- ii. සක්මන් කරමින්ය.
- iii. මුචලින්ද නා රජු සෙවනේය.
- iv. කිරිපළු රුක මූලය

(23). ත්‍රිපිටක ධර්මය පළමු වරට පුස්කොළ පොත්වල රචනා කිරීම සිදු කළේ,
- i. මාතලේ අළු විහාරයේදී ය.
- ii. වේළුවනාරාමයේදී ය.
- iii. මියන්මාරයේදී ය.
- iv. සප්තපර්ණී ගල්ගුහාවේදීය.

(24). පාලකයා ජනතාවගේ දියුණුව දැක සතුටට පත්වන්නේ නම් ඔහු තුළ ඇත්තේ,
i. මෙත්තාවයි. ii. කරුණාවයි iii. මුදිතාවයි iv උපේක්ෂාවයි

(25). පළමු, දෙවන, තෙවන ධර්ම සංගායනා පැවැත්වීමට මූලිකත්වය ගත් මහ රහතන් වහන්සේලා පිළිවෙලින්,
- i. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ,සබ්බකාමී යස මහරහතන් වහන්සේ, මොග්ගලීපුත්ත මහ රහතන් වහන්සේ
- ii. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ, මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේ, සබ්බකාමී යස මහරහතන් වහන්සේ
- iii. මොග්ගලීපුත්ත මහ රහතන් වහන්සේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ, සබ්බකාමී යස මහරහතන් වහන්සේ
- iv. මොග්ගලීපුත්ත මහ රහතන් වහන්සේ, සබ්බකාමී යස මහරහතන් වහන්සේ, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

(26). “මගේ මේ ව්‍යායාමය බුදු සසුනේ චිරස්ථිතිය පිණිස මිස රජ සැප පිණිස නොවේ” යන උදාර ප්‍රකාශය කළ රජතුමා වන්නේ,
   i. ධර්මාශෝක රජුය
   ii. දුටුගැමුණු රජුය
   iii. රාජසිංහ රජුය
   iv. ධාතුසේන රජුය

(27). පාලකයන් සමගිව නීතිගරුකව ක්‍රියාකළ යුතු බව, කාන්තාවන්ට ආරක්ෂාව සපයා දිය යුතු බව, පූජනීය ස්ථාන රකිමින් පැවිදි උතුමන්ට පහසුකම් සැපයිය යුතු බව අවධාරණය කරන්නේ,
   i. දසරාජ ධර්මවලිනි.
   ii. දස සක්විති වත් වලිනි
   iii. සප්ත අපරිහානීය ධර්ම වලිනි
   iv. නිත්‍ය සීල ප්‍රතිපදාව මගිනි

(28). රාජ්‍ය පාලනය ධර්මයක් වන සප්ත අපරිහානීය ධර්මවලට අයත් නොවන්නකි,
   i. නිතර නිතර රැස්වීම.
   ii. සමගිව රැස්ව සාකච්ඡා කිරීම
   iii. අනුන් කළ නොකළ දේ පිළිබඳ කතා කිරීම
   iv. රටේ පවත්නා නීති කඩ නොකළ සිටීම.

(29). කනිෂ්ක රජතුමා අනුග්‍රහයෙන් ඉන්දියාවේ පැවති හතරවන ධර්ම සංඝායනාවේ ප්‍රධානත්වය පැවරුණේ,
   i. මොග්ගලී පුත්ත තිස්ස තෙරණුවන්ටය.
   ii. පාර්ශව තෙරණුවන්ටය
   iii. මහා කාශ්‍යප තෙරණුවන්ටය
   iv. සබ්බකාමී තෙරණුවන්ටය

(30). ගිහි විනය නමින් ම හඳුන්වන සූත්‍ර දේශනාව වන්නේ,
   i. මහා මංගල සූත්‍රය
   ii. දම්සක් පැවතුම් සූත්‍රය
   iii. සිඟාලෝවාද සූත්‍රය
   iv. කරණීය මෙත්ත සූත්‍රය

(31). නිර්වාණය ලැබීම සඳහා ආර්ය මාර්ග ප්‍රතිපදාව පුරන හෙයින් සංඝරත්නය
   i. සාමීචි පටිපන්න නම් වේ
   ii. ඤායපටිපන්න නම් වේ
   iii. උජුපටිපන්න නම් වේ.
   iv. සුපටිපන්න නම් වේ

(32). ස්තූපයක ගර්භයට සම්බන්ධ සිව්දිසාවට මුහුණලා තනන ලද අලංකාර තොරණ වැනි අංගය හඳුන්වන්නේ,
   i. වාහල්කඩ නමිනි
   ii. වටදාගෙය නමිනි
   iii. චෛතියඝර යනුවෙනි
   iv. කොරවක්ගල නමිනි

(33). බුදු දහමේ දැක්වෙන පුද්ගල චරිත වර්ග සංඛ්‍යාව
   i. 8 කි.   ii. 6 කි.   iii.5කි.   iv. 4 කි.

(34). විහාරස්ථානයට ගොස් වැඳීමේ වඩාත් නිවැරදි පිළිවෙළ වන්නේ,
   i. ශාරීරික, උද්දේශික හා පාරිභෝගික චෛත්‍යයන් වැඳීමය
   ii. උද්දේශික, ශාරීරික හා පාරිභෝගික චෛත්‍යයන් වැඳීමය
   iii. ශාරීරික, පාරිභෝගික හා උද්දේශික චෛත්‍යයන් වැඳීමය
   iv. පාරිභෝගික, උද්දෙශික හා ශාරීරික චෛත්‍යයන් වැඳීමය.

(35). චුල්ල කම්ම විභංග සූත්‍රයට අනුව රූප ශෝභාව ලැබීමට කළ යුත්තේ,
   i. අලස බවින් තොරව සිටීමයි
   ii. කිපෙන සුළු ගතියෙන් නොසිටීමයි
   iii. මසුරුකමින් තොරව සිටීමයි
   iv. හිංසා කිරීමෙන් තොරව සිටීමයි

(36). ලැබීම් අතර වඩාත් වටිනාම ලාභය වන්නේ,
i. නීරෝගී බව ලැබීමයි.
ii. අධ්‍යාපනය ලැබීමයි
iii. ආර්ථික සම්පත්තිය ලැබීමයි
iv. මිතුරන් ලැබීමයි

(37). දහම් ගුණ අතරට නොවැටෙන්නේ ...................................... ගුණය යි.
i. ඒහි පස්සිකෝ
ii. ආහුනෙයොා්
iii. සන්දිට්ඨිකෝ
iv. ස්වාක්ඛාතෝ

(38). ධර්ම භාණ්ඩාගාරික තෙරුන් ලෙස හඳුන්වන්නේ,
i. සැරියුත් මහරහතන් වහන්සේ ය .
ii. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය .
iii. මුගලන් මහරහතන් වහන්සේ ය .
iv. ආනන්ද තෙරුන් වහන්සේය.

(39). දානය, ප්‍රිය වචනය, අර්ථ චරියාව සමානාත්මතාව වශයෙන් දැක්වෙන්නේ,
i. සතර කර්ම ක්ලේශයන්ය.
ii. සතර සතිපට්ඨානය
iii. සතර සංග්‍රහ වස්තූන්ය
iv. සතර බ්‍රහ්ම විහරණයන්ය.

(40). බුදු දහමේ උගන්වන පංචස්කන්ධය,
i. රූප,ශබ්ද,ගන්ධ, රස , ස්පර්ශ නම් වේ.
ii. චක්ඛු , සෝත, ඝාණ, ජිව්හා, කාය නම් වේ.
iii. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නම් වේ.
iv. පඨවි, ආපෝ, තේජෝ, වායෝ නම් වේ.

**II කොටස**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01).

i. සත්‍ය සොයා යාමේදී බෝසතාණන් වහන්සේට හමු වූ ධ්‍යානලාභී ගුරුවරුන් දෙදෙනා නම් කරන්න.

ii. නියාම ධර්ම දෙකක් නම් කරන්න.

iii. බුදු දහමින් ප්‍රතික්ෂේප කෙරෙන අන්ත දෙක නම් කරන්න.

iv. ශීලයේ ප්‍රභේද දෙක නම් කරන්න.

v. භාවනාවේ ප්‍රභේද දෙක නම් කරන්න

vi. පහත සඳහන් වචන වල අර්ථ ලියන්න.

I. විචිකිච්චා

II. ඒහි පස්සිකෝ

vii. ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ප්‍රඥාවට අයත්වන අංග දෙක කුමක්ද?

viii. ජීවී පරිසරයේ ආරක්ෂාව තහවුරු කරමින් බුදුරජාණන් වහන්සේ සත්ත්ව ජීවිත සුරක්ෂිත කිරීමට පියවරගත් අවස්ථා දෙකකට උදාහරණ ලියා දක්වන්න.

ix. පත්තකම්ම සූත්‍රයේ සඳහන් පංච බලි අතරින් හතරක් නම කරන්න

x. ධර්මරත්නයේ ගුණ දෙකක් තේරුම් සහිතව ලියන්න.

(02).

i. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙන් ලබාගත හැකි නායකත්ව ලක්ෂණ දෙකක් ලියන්න.
ii. ඉන් එකක් විස්තර කරන්න.
iii. එකී ගුණ ධර්ම පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට ඉවහල්වන අයුරු පහදන්න

(03).

i. ස්වාමි - භාර්යා, සේව්‍ය - සේවක සම්බන්ධතා පෙන්වා ඇති දිශා දෙක නම් කරන්න.
ii. ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට යුතුකම් පහක් ඉටුකළ යුතුව ඇත ඉන් තුනක් ලියන්න.
iii. ගිහි පැවිදි සමාජය එකිනෙකාට ඉටුවිය යුතු යුතුකම් ඉටුවන විට සමාජය ද යහපත්ව ගොඩනැගෙන ආකාරය ඔබ ලබා ඇති අත්දැකීම් අනුව ගෙනහැර දක්වන්න.

(04).

i. "අත්තනාව කතං පාපං" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න
ii. ඉහත සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න.
iii. ආධ්‍යාත්මික පාරිශුද්ධත්වය ශිෂ්‍ය ජීවිතය අර්ථවත් කරන්නේ කෙසේද පැහැදිලි කරන්න.

(05).

i. පටිච්ච සමුප්පාදයේ විග්‍රහ කෙරෙන ප්‍රධාන කරුණු දෙක නම් කරන්න.
ii. ද්වාදසාංග පටිච්ච සමුප්පාදයේ කරුණු තුනක් තේරුම් සහිතව පිළිවෙළින් නම් කරන්න.
iii. නිවන් ලැබීමට බුදු දහමේ මූලික කරුණු අවධානය කරගත යුතුය. විමසන්න.

(06).

i. ''තිදොරින් කරන දෙආකාර ක්‍රියා'' එම ආකාර දෙක නම් කරන්න.
ii. විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද තුනක් ලියන්න.
iii. යහපත් චරිත සංවර්ධනය විෂයෙහි චුල්ලකම්ම විභංග සූත්‍රය යොදාගත හැකි ආකාරය එම සූත්‍රයේ කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(07).

i. බුදු දහමේ භාවනාව යන්න හඳුන්වා ඇත්තේ කෙසේද?
ii. භාවනාවට යොමුවන තැනැත්තා ඉටුකළ ගත යුතු පූර්ව අවශ්‍යතාවයන් තුනක් ලියන්න.
iii. වර්තමාන සමාජයේ විවිධ අපචාරයන්ට ප්‍රධානම හේතුව මිනිසුන්ගේ අසංවර විසිරුනු සිත්ය. එකී මිනිසුන්ගේ සිත් සුවපත් කර ගැනීමට භාවනාව යොදාගත හැක්කේ කෙසේ දැයි විමසන්න.

(08). පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. දුටුගැමුණු මහ රජතුමා
ii. බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය
iii. ත්‍රිලක්ෂණයයි.
iv. කණිෂ්ක සංගායනාවයි.